13-07-2023

Learning Resource Centre
R
De Mazenod College
Kandana

# ද මැසිනොද් විදුහල

## සිංහල භාෂාව හා සාහිත්‍ය

## පළමු වාර විභාගය 2023

## 6 ශ්‍රේණිය

නම : ............................................................................ අංකය : ..............................

කාලය පැය 02 යි.

### I කොටස

- පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. මාර්ටින් වික්‍රමසිංහ මහතා අතින් රචිත කෘතියක් වන්නේ,

   i. හත්පණ　　　　iii. කව් මිණ

   ii. මුතිගුණ අලංකාරය　　　　iv. අපේ ගම

2. සිංහල අක්ෂර මාලාවේ ස්වර පමණක් යෙදී ඇති වරණය වන්නේ,

   i. ඒ - අ - ග - ම　　　　iii. ඓ - ඕ - අ - ඖ

   ii. ය - ඊ - එ - ඉ　　　　iv. ඖ - න - ඇ - ඈ

3. පහත සඳහන් මුල් පදයට නිවැරදි අනුක්ත පදය ඇතුලත් වරණය වන්නේ,

   i. අපි - අප　　　　iii. මිනිසෙක් - මිනිසා

   ii. බල්ලා - බල්ලන්　　　　iv. ළමයෙකු - ළමයා

4. ......................... පොත් පාඩම් කළෙහි.

   i. නුඹලා　　　　iii. නුඹ

   ii. අපි　　　　iv. ඇය

5. සිරිත් මල්දම කෘතිය රචනා කරන ලද්දේ කවුද?

   i. මහගමසේකර　　　　iii. කුමාරතුංග මුනිදාස

   ii. එස්. මහින්ද හිමි　　　　iv. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා

6. Vanished Trails කෘතියේ සිංහල පරිවර්තනය කුමක්ද?

i. ගීත් සැරය iii. මැකී ගිය අඩමං

ii. අපේ ගම iv. තුන් බෑ යෝධයෝ

7. වැදි ජනයා පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ ලිවූ විදේශීය විද්වතෙකු වන්නේ,

i. පි. බී. මීගස්කුඹුර iii. ඩී. ජී. සෙලිග්මාන්

ii. ආර්. එල්. ස්පිට්ල් iv. ඒ. පී. ගුණරත්න

8. පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,

i. අ iii. උ

ii. ඒ iv. ඔ

9. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. චිත්තාකර්ෂනිය iii. චිත්තාකර්ෂණීය

ii. චිත්තාකර්ශණීය iv. චිත්තාකර්ශනීය

10. ඇලපිල්ල පමණක් යෙදී ඇති වචනය තෝරන්න.

i. පිහිය iii. තාරාවා

ii. ආප්ප iv. තොප්පිය

11. සිංහල හෝඩියේ මහප්‍රාණ අක්ෂර ගණන වනුයේ,

i. 5 කි. iii. 10 කි.

ii. 7 කි. iv. 12 කි.

12. පහත දී ඇති පද අතුරින් උක්ත නාම පදය තෝරන්න.

i. ළමයින් iii. අප

ii. මම iv. බල්ලෙකු

13. ස්වරයක් හෝඩියේ දැක්වෙන ස්වරූපයෙන්ම ලියන්නේ කුමන ස්ථානයක යෙදෙන විටද?

i. මුල iii. මැද

ii. මැද හෝ අග iv. මුල, මැද හෝ අග

14. සඤ්ඤක අක්ෂරයක් යෙදී නැති වචනය තෝරන්න.

i. කොළඹ      iii. දඬුවම

ii. සුළඟ      iv. කුණ්ඩාඩිය

15. පහත නාමපද අතරින් අචේතනික නාම පදය වනුයේ,

i. ගිරවා      iii. පාලම

ii. බල්ලා      iv. රාස්සි

16. ස්ත්‍රී ලිංග බහුවචන නාම පදයකි.

i. ගෙවිලියක      iii. ගෙවිලියෝ

ii. ගෙවල්      iv. ගෙවිලියක්

17. නරියා සූදානම් වන්නේ කුකුළා ඩැහැගැනීමට ය.

i. අල්ලා ගැනීමට.      iii. සපා කෑමට.

ii. ගිල ගැනීමට.      iv. උදුරා ගැනීමට.

18. මෙතනින් පාර මාරු වෙනු !

i. ප්‍රශ්නාර්ථ ලකුණ.      iii. විස්මයාදි ලකුණ.

ii. පෙරළි කොමා.      iv. උඩු කොමා.

19. විජය කුමරු පැමිණියේ කුමන රටේ සිට ද?

i. පාකිස්තානයේ      iii. බංගලාදේශය

ii. ඉන්දියාවේ      iv. නේපාලය

20. පහත පද්‍ය සම්පූර්ණ කරන්න.

උදයට පුබුදු      දී

.......................................................

.......................................................

ගේ දොර හම      දී

( ලකුණු 2 x 20 = 40 )

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) ඔබ විසින් සකස් කරන ලද පොත් පිංච ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. ඔබ සකස් කළ පොත් පිංචට යෙදූ නම කුමක්ද?

II. ඔබ පොත් පිංච සැකසීමට තොරතුරු සොයාගත් ආකාර 3 ක් ලියන්න.

III. ඔබ පොත් පිංචට ඇතුළත් කළ කතා 2 ක නම් ලියන්න.

IV. පොත් පිංච සකස් කිරීමේදී ගුරුතුමිය දුන් උපදෙස් 2 ක් ලියන්න.

V. පොත් පිංච සැකසීමේදී ඔබ මුහුණ දුන් ගැටලු 2 ක් ලියන්න.

( ලකුණු 16 )

2) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

I. වැඩිහිටි ඔවදන් පිළිපදිමු.

II. අපි සුන්දර පරිසරයක් ගොඩනගමු.

III. උදෑසනක අසිරිය.

IV. ජල සම්පත සුරකිමු.

( ලකුණු 14 )

3) නිකම් ඉඳීමෙන් පල නෑ ගේ මුල්ලේ

..........................................................................................

කියන්නවුන් මෙන් ගන තිල් කැලෑවේ

..........................................................................................

I. ඉහත කවිය සම්පූර්ණ කරන්න.

II. එහි රචකයා කවුද?

III. මෙම කවි පන්තිය ඇතුළත් පාඩමේ නම කුමක්ද?

IV. මෙහි සඳහන් ආකාරයට කුරුල්ලන් අපට දෙන පණිවිඩය කුමක්ද?

V. මෙහි සඳහන් ප්‍රථම පුරුෂ උක්ත පදයක් ලියන්න.

( ලකුණු 10 )

4) පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථ නාම හා කතුවරුන් ලියා වගුව සම්පූර්ණ කරන්න.

| පාඨය | උපුටා ගත් ග්‍රන්ථයේ නම | කතුවරයා |
|---|---|---|
| 1. '' හා, හා, මම එහෙමත් කරනවද? '' | | |
| 2. " මහවනය රාත්‍රී කාලයේ ශාන්ත හෝ නිශ්චල හෝ නොවේ '' | | |
| 3. '' ඔහු බිම සදාලා ගෙදර ඇවිත් වැපිරීමට වී ඉල්ලුවේ ය. '' | | |
| 4. '' අනුන්ට බුහුමන් දී සලකන්නේ '' | | |
| 5. " එතැන් සිට රෑ ගතවන තුරු උද්‍යෙන් නගින ගීත්න නොනිවේ. '' | | |

( ලකුණු 10 )

5) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සාමාන්‍ය වශයෙන් කොස් ගෙඩිය ඉදෙන්නට ප්‍රථම ගෙඩිය නෙළාගනු ලැබේ. ගෙඩියේ පැසුණු නොපැසුණු බව දැන ගනු ලබන්නේ එහි පිටතින් සියුම් සිදුරක් කොට මදුලු කැබැල්ලක් හෝ ගෙන බලාය. කොස් ගෙඩි පලු කොට කපා මදුලු වෙන් කොට ගෙන තම්බා බත් වෙනුවට කුස පුරා අනුභව කරති. ඔවුන් කොස් කන්නේ අපේ රටවාසීන් 'ටර්නිප් ' හෝ ගෝවා කන්නාක් මෙනි. මේ කොස් තැම්බුම රසයෙන් ද සුවඳින් ද ගෝවාවලට සමානය. පැසී ඉදුණු කල හෙවත් වැළ හෝ වරකා වූ කල සුමධුර රසයකින් යුක්ත වූ මෙය නොපිස ම කනු ලැබේ. පැසුණු කොස් ඇට පාටින් හා සුවඳින් පමණක් නොව, රසයෙන් ද අපේ රටේ 'චෙස්නට්' ගෙඩිවලට සමාන ය.

I. කොස් ගෙඩිය නෙළා ගනු ලබන්නේ කෙසේ ද?
II. කොස් ගෙඩිය පැසුණු නොපැසුණු බව දැන ගන්නේ කෙසේ ද?
III. බත් වෙනුවට ආදේශක ආහාරය කුමක්ද?
IV. නොපිසම කෑමට ගන්නේ මොනවාද?
V. චෙස්නට් ගෙඩිවලට සමාන මොනවා ද? ( ලකුණු 10 )